චක්‍රලේඛ අංක - 05/2012

මගේ අංකය-ධ.ප.ස.සේ.කො./ලේ.ඩී/2012
සමුපකාර සේවක කොමිෂන් සභාව,
121/3, කිරුළපන මාවත,
කොළඹ 05.
2012.04. 30

බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
ස.ණ.ස.සමිතිවල
සභාපතිවරුන් වෙත.

## බස්නාහිර පළාත් සමුපකාර සේවකයින් සඳහා වැටුපෙන් 15%ක දීමනාවක් ගෙවීම.

සමුපකාර සමිතිවල සේවයේ නියුක්ත ස්ථිර සේවකයින් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි දීමනා රහිත මූලික මාසික වැටුපෙන් 15%ක විශේෂ දීමනාවක් ලබාදිය හැකිය.

01. මෙම විශේෂ දීමනාව ගෙවීමට මූල්‍යමය හැකියාව සමිතිය/සංගමය සතුවිය යුතු අතර, ඒ පිළිබඳව සමිතියේ/සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙවීමට සුදුසු බව තීරණය කළ පසුව මෙම විශේෂ දීමනාව ගෙවිය හැකිය.

02. මෙම විශේෂ දීමනාව ගෙවීම ආරම්භ කළ යුතු දිනය අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව විය යුතුය.

03. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීමේදී සහ විශ්‍රාම පාරිතෝෂිකය ගණනය කිරීමේදී මෙම විශේෂ දීමනාව ඇතුලත් නොකළ යුතු අතර, එම සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට දායක මුදල් සම්බන්ධයෙන් වන කල්හි එම කම්කරු නීතිරීති අනුව කටයුතු කළ යුතු වේ.

04. දෛනික වැටුප් ලබන සේවකයින්ට ද මෙම විශේෂ දීමනාව හිමිවිය යුතු අතර, දෛනික වේතනය මත ගෙවනු ලබන සියයට පහලොවක ( 15%ක ) විශේෂ දීමනාවක් ගෙවිය යුතුය .

05. අනියම් හෝ තාවකාලික පදනමේ වැටුප් ලබන සේවකයින්ට ද දීමනා රහිත මූලික මාසික වැටුපෙන් සියයට පහලොවක ( 15%ක ) විශේෂ දීමනාවක් ගෙවිය යුතු ය.

06. කොමිස් පදනමේ සේවකයින් ට මෙම විශේෂ දීමනාව හිමි නොවේ.

07. ඉහත කී විශේෂ දීමනාව ගණන් බැලීමේදී වැරදියට ගණන් බැලීම නිසා හෝ සේවකයා දැනට ලබන දීමනා රහිත මූලික මාසික වැටුප වැරදි වීම නිසා වැඩිපුර ගෙවා ඇති යම් මුදලක් වේද, එය සේවකයාගේ වැටුපෙන් එකවර හෝ කොටස් වශයෙන් හෝ පසුව අයකරගත යුතුය. එසේ ආපසු අයකරනු ලබන මුදල් සේවකයාගේ වැටුපෙන් සියයට හතලිහක ( 40%ක ) සීමාවට අයත් නොවේ.

08. මෙම විශේෂ දීමනාව ගෙවීම සම්බන්ධයෙන් සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණය 2012.06.01 දිනට පෙර කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

අයි.ආර්.සෝමසිරි,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් -

1. බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්
3. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යාංශය
4. බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්
5. සමූපකාර සංවර්ධන කොමසාරිස් (කොළඹ/කළුතර/ගම්පහ)
6. ලේකම්, මධ්‍යම රජයේ සමූපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමූපකාර කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වෘත්තීය සමිති සංගම්